අන්තර්ජාල අනුවාදයකි.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1999 අංක 6 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කලේ 1999 මාර්තු මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 මාර්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **3.50** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

## 1999 අංක 6 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 මාර්තු මස 26 වන දින.]

එල්. ඩී.–ඕ. 3/98

### බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයකු වන හෙයින් ද, ශ්‍රී ලංකාවට ඒ අරමුදලේ සාමාජිකයකු වීමට හැකි කරනු ලැබූ බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සම්මත කිරීමට පෙරාතුව ඒ අරමුදලේ මුල් ගිවිසුම් කොන්දේසි පාඨය පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබනු ලැබූ හෙයින් ද:

අරමුදලේ පාලක මණ්ඩලය විසින් 1997 සැප්තැම්බර් මස හොංකොංහි දී පවත්වන ලද වාර්ෂික රැස්වීමේ දී, ඒ අරමුදලේ දැනට සිටින හා නව සාමාජිකයන්ට එක් වතාවකට සීමා වූ විශේෂ ගැනුම් හිමිකම් වෙන්කර දීමක් සඳහා විධිවිධාන සලසන එකී මුල් ගිවිසුමේ සංශෝධනයක් (ඒ සංශෝධනය, මෙම පූර්විකාවෙහි මින් මතු "යෝජිත සංශෝධනය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.) අනුමත කරන ලද හෙයින් ද :

යෝජිත සංශෝධනයේ පාඨය, 1998 අගෝස්තු මස 4 වන දින දී පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබන ලද හෙයින් ද:

එකී එක් වතාවකට සීමා වූ විශේෂ ගැනුම් හිමිකම් වෙන්කර දීමේ අයිතිවාසිකම්වල ප්‍රතිලාභය ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකිවන පරිදි එම යෝජිත සංශෝධනය පිළිගැනීමට, ආණ්ඩුව තීරණය කර ඇති හෙයින් ද:

ඒ තීරණයට පූර්ණ බලය ලබා දීම හා ඒ තීරණය බලගැන්වීම පිණිස බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සංශෝධනය කිරීම අවශ්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත, 1999 අංක 6 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් වූ ගිවිසුම් කොන්දේසිවලට කරන ලද හතරවන සංශෝධනය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන දිනය වශයෙන්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

424 වන අධිකාරයේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2**. බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනතේ, 10 වන වගන්තියේ, "අරමුදල් ගිවිසුම" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

'අරමුදල් ගිවිසුම' යන්නෙන් –

(අ) විශේෂ ගැනුම් හිමිකම් පදනම් කරගනු ලැබූ පහසුකමක් ඇති කරලීම පිණිස (එකී සංශෝධනයේ පාඨය 1968 නොවැම්බර් මස 23 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි තබන ලදී.) ; සහ

(ආ) නව ජාත්‍යන්තර මුල්‍ය ක්‍රමයක් සංස්ථාපනය කිරීම පිණිස, (එකී සංශෝධනය 1978 අප්‍රේල් මස 4 වන දින ජාතික රාජ්‍ය සභාව ඉදිරියෙහි තබනු ලැබූ අරමුදලේ ගිවිසුම් කොන්දේසිවල පාඨයෙහි ඇතුළත් කරන ලදී. ; සහ

(ඇ) ඒ ව්‍යවස්ථා යටතේ වූ ස්වකීය බැඳීම් ඉටු නොකරන සාමාජික රටක ඡන්දය දීමේ හා ඊට සම්බන්ධ අයිතිවාසිකම් අත්හිටුවීම සඳහා විධිවිධාන සැලසීම පිණිස (එකී සංශෝධනයේ පාඨය 1991 ඔක්තෝබර් මස 11 වන දින පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබන ලදී.) ; සහ

(ඈ) අරමුදලේ දැනට සිටින හා නව සාමාජිකයන්ට එක් වතාවකට සීමා වූ විශේෂ ගැනුම් හිමිකම් වෙන්කර දීමක් සඳහා විධිවිධාන සැලසීම පිණිස (එකී සංශෝධනයේ පාඨය 1998 අගෝස්තු මස 4 වන දින දී පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබන ලදී.)

මුලින් සම්මත කොට ඉන් අනතුරුව සංශෝධනය කරන ලද පරිදි, ජාත්‍යන්තර මුල්‍ය අරමුදලේ ගිවිසුම් කොන්දේසි අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.